සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- ප්‍රශ්න අංක 01 සිට 15 දක්වා සියළු ම ප්‍රශ්නවලටත් ප්‍රශ්න අංක 15 - 20 දක්වා ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් කොටසට අනුව පිළිතුරු සපයන්න.

## I කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා හිස්තැනට සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) නර්තනයේ දී සිරුර හසුරුවන ආකාරය අනුව ඇස්, ඇහිබැම යන අංග ................................ කොටසට අයත් වේ.

(1) අංග (2) ප්‍රත්‍යාංග (3) උපාංග (4) ශරීරාංග

(02) මාත්‍රා, ආඝාතය හා සංඥා යන වචන ............................. හා බැඳී පවතී.

(1) ප්‍රස්තාරකරණය (2) නර්තනය
(3) නාට්‍යකරණය (4) ලය

(03) විකල්ප වාද්‍ය උපකරණයක් **නොවන්නේ** .................................. ය.

(1) රබාන (2) ගොප්කොළ නළාව
(3) දඬුබෙරය (4) ටොනික් පියන් වළල්ල

(04) තනි තිතෙහි ප්‍රභේද ............................

(1) දෙකකි. (2) එකකි. (3) තුනකි. (4) හතරකි.

(05) 'සුන්දරයි උදේ ලස්සන මල් පිපී තිබේ' මෙම ගීතය අනුව නර්තනයේ යෙදීමේදී ....................... ප්‍රකාශ වේ.

(1) හාස්‍ය (2) කරුණාව
(3) භක්තිය (4) සතුට

- **ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(06) ගැටබෙරය, යක් බෙරය, දවුල යන වාද්‍ය භාණ්ඩ භාවිතා කරන නර්තන සම්ප්‍රදායන් පවතින ප්‍රදේශ පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) මහනුවර, කෑගල්ල, රත්නපුරය
(2) උඩුනුවර, ගාල්ල, රත්නපුරය
(3) මහනුවර, කළුතර, ගාල්ල
(4) අම්බලන්ගොඩ, ගාල්ල, රත්නපුරය

Department of Education – Western Province

- **07 සහ 08 ප්‍රශ්න අංක සඳහා පහත රූප සටහන් ඇසුරු කරගන්න.**



A



B



C

(07) A රූපයෙන් දක්වෙන්නේ උඩරට නර්තන සම්ප්‍රදායට අයත්,

(1) වෙස් ඇඳුම් කට්ටලයයි. (2) පබළු ඇඳුම් කට්ටලයයි.

(3) පන්තේරු ඇඳුම් කට්ටලයයි. (4) තෙල්මෙ ඇඳුම් කට්ටලයයි.

(08) B රූපයෙන් දක්වෙන ඇඳුම් කට්ටලය දැකිය හැකි ශාන්ති කර්මය වන්නේ,

(1) කිරි මඩුවයි. (2) කොහොඹා කංකාරියයි.

(3) පහන් මඩුවයි. (4) දෙවොල් මඩුවයි.

(09) ගොප් කොළ වලින් නිර්මාණය කළ <u>නොහැකි</u> අංගයකි.

(1) රූං පෙත්ත (2) නළාව

(3) තාරුකා මල (4) කඩුව

(10) චෙම්බු හා කෝලාට්ටම් යනු ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන සිංහල ගැමි නැටුම් වේ.

(1) කුළු හා ලී (2) කළගෙඩි හා ලී

(3) ලී සහ ගොයම් (4) ගොයම් සහ කළගෙඩි

- **පහත A තීරුවේ පද සමග සම්බන්ධතාවයක් ඇති වචනය B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| (11) | කැරොල් ගායනා | නැලවිලි කවි |
| (12) | සාරධර්ම | තාලම්පට |
| (13) | ලයාන්විත බව | සමබරතාවය |
| (14) | තිත්, තෙයි | නත්තල් උත්සවය |
| (15) | නම්‍යතා අභ්‍යාස | ගුරු ගෙදර |

## <u>II උඩරට</u>

(16) තෙයියත් තෙයියත් තෙයියත් තාම් - තෙයිතාම්...... මෙම පද කොටස

(1) කස්තිරමකි. (2) හමාර පදයකි.

(3) අඩව්වකි. (4) නමස්කාර පදයකි.

Department of Education – Western Province

(17) දෙවන ගොඩ සරඹ යේ කස්තිරම වනුයේ,

(1) රුංතක ජිංතක තරිකිට කුංදත්තා ය.

(2) දොම්කිට කිට දොම් ය.

(3) තත්ජිත් තකජිත් තත්ජිත් තොං නං තා ය.

(4) තත්ජිත් තොං නං තා ය.

(18) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය,

(1) කොහොඹා කංකාරි ශාන්ති කර්මයයි.

(2) දෙවොල් මඩු ශාන්ති කර්මයයි.

(3) කඩවර කංකාරියයි.

(4) පහන්මඩු ශාන්ති කර්මයයි.

(19) 'දුටින් අයෙක් සටපටින් පැනුම් රළි.....මෙම කවි පදයේ ඉතිරි කවි පාදය නම්

(1) ඉතින් නැතැයි පෙනුමා ය.

(2) පැතුම් විලස දුරුමා ය.

(3) පිටින් බියැති බැලුමා ය.

(4) පොටින් නෙරා හෙවුමා ය.

(20) මුල් යුගයේ දී වන්නම් රචනා වී ඇත්තේ,

(1) ගායනය සඳහා ය. (2) වාදනය සඳහා ය.

(3) නාට්‍යකරණය සඳහා ය. (4) නර්තනය සඳහා ය.

(ලකුණු 20)

Department of Education – Western Province

## **III** පහතරට

(16) තෙයි තෙයි තා කිට තෙයියත් තා........ මෙම පද කොටස

(1) ඉරට්ටියකි. (2) හමාර පදයකි.

(3) අන්තාඩියකි. (4) නමස්කාර පදයකි.

(17) දෙවන ඉලංගම් සරඹ යේ ඉරට්ටිය වනුයේ,

(1) රුද කිට තත් දොම් ය. (2) ගතිකිට ගත දොම් ය.

(3) දිත ගුද තා ය. (4) දිත් තා ය.

(18) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය,

(1) දෙවොල් මඩු ශාන්ති කර්මයයි.

(2) ගරායක් ශාන්ති කර්මයයි.

(3) පහන්මඩු ශාන්ති කර්මයයි.

(4) කිරි මඩු ශාන්ති කර්මයයි.

(19) 'නෙත රකිනේ පත් කුසුම රොනේ.... මෙම කවි පදයේ ඉතිරි කවි පද කොටස නම්,

(1) රන් තලිනේ නව පලු විලසේ ය.

(2) විස්කම් සුරිඳේ ගත්තුගු පලසේ ය.

(3) සිය කුල දෙරණේ වැඩි සුරතුරසේ ය.

(4) ගත් බිගු ලෙසිනේ මිණි බරණ දිසේ ය.

(20) මුල් යුගයේ දී සිංදු වන්නම් රචනා වී ඇත්තේ,

(1) ගායනය සඳහා ය. (2) වාදනය සඳහා ය.

(3) නාට්‍යකරණය සඳහා ය. (4) නර්තනය සඳහා ය. (ලකුණු 20)

## IV සබරගමු

(16) තෙයා///// තෙයියත් තාම්, තේයි තාම්...... මෙම පද කොටස

(1) කලාසමකි. (2) හමාර පදයකි.

(3) අඩව්වකි. (4) නමස්කාර පදයකි.

(17) දෙවැනි දොඹින පදය වනුයේ,

(1) තෙයි තෙයි ය. (2) ජිංත ජිමිත්තත් ය.

(3) තෙයි තක ය. (4) තෙයි තෙයි තක ය.

(18) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මය,

(1) පහන්මඩු ශාන්ති කර්මයයි.

(2) දෙවොල් මඩු ශාන්ති කර්මයයි.

(3) ගී මඩු ශාන්ති කර්මයයි.

(4) කිරිමඩු ශාන්ති කර්මයයි.

(19) 'අනිලා හඬ දෙන මෙන් ගුවනට.... මෙම කවි පදයේ ඉතිරි පද කොටස නම්,

(1) වැඩලා සිට සිංහාසන පිට ය.

(2) එකලා කී වන්නම පෙර සිට ය.

(3) පවන් වේගයෙන් කීවේ මෙලෙසට ය.

(4) කියලා යන නාළුඅසා සිට ය.

(20) මුල් යුගයේ දී වන්නම් රචනා වී ඇත්තේ,

(1) ගායනය සඳහා ය. (2) වාදනය සඳහා ය.

(3) නාට්‍යකරණය සඳහා ය. (4) නර්තනය සඳහා ය.

(ලකුණු 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 03කි.)**

(01) පංති කාමරයේ දී ඔබ උගත් විවිධ ජන වර්ග හා බැඳි උත්සවයන් මතකයට නංවාගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'බෙත්ලෙහෙම්පුරේ..... දිළිඳු ගවලෙනේ.....'

(1) ඉහත ගීතය නිතර ශ්‍රවණය වන්නේ කුමන උත්සව සමයක දී ද? (ලකුණු 02)

(2) එම උත්සවය තුළින් සංවර්ධනය කරගත හැකි ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) එම උත්සවයේ දී හා වෙසක් උත්සවයේ දී දක්නට ලැබෙන සැරසිලි අංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

Department of Education – Western Province



(4) ඉහත රූපයේ දැක්වෙන සැරසිල්ල අයත්වන උත්සවය නම් කරන්න. (ලකුණු 02)

(5) එම උත්සව අවස්ථාවේ දී පූජාර්ථය හා විනෝදය මුල්කරගෙන කරනු ලබන නර්තන අංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(02) (1) මාත්‍රා 2 තනි තිතට අදාල රබන් පදයක් ලියන්න. (ලකුණු 02)

(2) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් මාත්‍රා 2 තනි තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(3) මාත්‍රා 2 තනිතිතට අදාල කවි පද දෙකක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(03) 'සමන් දේවාල පෙරහැරේ අසිරිය විස්තර කරමු'

(1) පෘතුග්‍රීසි ආක්‍රමණවලින් පසුව සමන් දේවාලය ප්‍රතිසංස්කරණය කරන ලද්දේ කුමන රජු විසින් ද? (ලකුණු 02)

(2) සමන් දේවාල පෙරහැර හා ගමන් ගන්නා තවත් පෙරහැර 03ක් ලියන්න. (ලකුණු 03)

(3) පෙරහැර මංගල්‍යයෙන් පසු සමාජය අතර ගොඩ නැඟෙන යහපත් ගුණාංග පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

(04) (1) දේශීය නර්තන සම්ප්‍රදායන් තුන නම් කරන්න. (ලකුණු 03)

(2) එම සම්ප්‍රදායන් ත්‍රිත්වයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(3) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය නම් කර එම සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියා පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

(05) (1) ගැමි නැටුම් වල විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(2) ගැමි නැටුම් සඳහා යොදා ගන්නා උපකරණ 03 ක රූප සටහන් අඳින්න. (ලකුණු 03)

(3) ඉහත උපකරණයකට අදාල ගැමි නැටුමකට අයත් කවියක් ලියන්න. (ලකුණු 04)

Department of Education – Western Province